මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව - මාලිම්බඩ**
**மாலிம்பட பிரதேச சபை - மாலிம்பட**
**MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA**

දිනය :- 2022.04.25
திகதி :-
Date :-

දු.ක./ෆැක්ස් **தொலைபேசி/ தொலைநகல்** Telephone / Fax:- 041-2240208

# <u>මාලිම්බඩ ප්‍රාදේශීය සභාව</u>
# <u>2022.05.17 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව</u>

සහභාගීත්වය :-
ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා

නොපැමිණීම:-
ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 මැයි මස මාසික සභා රැස්වීම 2022.05.17 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

## ***01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.***

<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>
2022.04.07 සභා වාර්තාවේ 04 පිටුවේ මම කරපු කතාව "අපි කිව්වම නිලධාරීන්ට සභාපතිතුමා කිවුවේ නැතිව යන්න බැහැයි කියනවා කියලා" ලෙස සංශෝධනය විය යුතුයි.

ඉහත සංශෝධනයට යටත්ව 2022 අප්‍රේල් මස 07 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා

ඒ අනුව 2022.04.07 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සහා සම්මත කරන ලදී.

***02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන***

ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ වියදම් සැලකිල්ලට ගෙන 2023 වර්ෂය වෙනුවෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මගින් සම්පාදනය කිරීමට නියමිත අයවැය සඳහා ගරු සභික මහත්ම මහත්මීන්ගේ අදහස් හා යෝජනා ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘතියක් සමග ලබා දෙන ලෙස දැනුම් දෙනවා.

***03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.***

- විෂය නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද "හොරගොඩ මුස්ලිම් ගම්මානය ආශ්‍රිතව කසල බැහැර කිරීමේ ස්ථානයක් ලබා දීම " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂක විසින් ඉදිරිපත් කර තිබූ "වරිපනම් බල ප්‍රදේශය පුළුල් කිරීම සම්බන්ධව " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- විෂය නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද "ඉඩම් අනුබෙදුම් SD/2022/82,128 සම්බන්ධවයි " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ විසින් එවා තිබූ "අස්ථාවර රැඳවුම් බැම්ම ඉවත් කර ගැනීම. බොකුටුගහහේන,දම්පැල්ල,තෙලිජ්ජවිල" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

***04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත***

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

**<u>යෝජනා අංක 5:1</u>**

2022/03/15 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 5:1</u>**

2022/03/15 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:2</u>**

2022/04/07 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 5:2</u>**

2022/04/07 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:3</u>**

ජංගම පුස්තකාලය ආරම්භ කිරීම සඳහා රුපියල් ලක්ෂ පහක් වටිනා පොත් මිලදී ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 5:3</u>**

ජංගම පුස්තකාලය ආරම්භ කිරීම සඳහා රුපියල් ලක්ෂ පහක් වටිනා පොත් මිලදී ගැනීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:4</u>**

බල ප්‍රදේශය තුළ නව නිපැයුම්කරුවන් හඳුනා ගැනීමටත් වැඩිදියුණු කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>**

මම මේ යෝජනාව ඉදිරිපත් කළේ අපි පහුගිය අවුරුදු 04 තුළම සංවර්ධන කටයුතු කළා. පාරවල් හැදුවත්, පැතිබැම් හැදුවත්, මාර්ග සංවර්ධන කටයුතු කළත් අපේ බල ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය දියුණු කිරීම සඳහා ඇත්තටම ක්‍රියා මාර්ග ගත්තා අඩුයි. ඒ නිසා මට හිතුණා අපේ බල ප්‍රදේශය තුළ සිටින නව නිපයුමක් හරි වෙනත් නිෂ්පාදනයක් හරි කරන අය හඳුනාගෙන එයාලට තියෙන ගැටලු මොනවාද? ඔවුන්ට සභාව මගින් උදව් උපකාර කළ හැක්කේ කුමන ආකාරයටද?යන්න සොයා බලන්න. ඒ වගේම දැන් අපි කොට්ඨාස 10 ට නම් කරපු නිලධාරීන් මගින් ඒ ඒ කොට්ඨාසවල නව නිපයුම් කරන අය පිළිබඳව සොයා බලා ඔවුන්ගේ අදහස් අරගෙන ඔවුන්ට යම් දිරිගැන්වීමක් කරන්න පුළුවන්. ඔවුන්ට වෙළඳපොළක් හදල දීල යම් යම් යන්ත්‍රෝපකරණ අවශ්‍ය නම් ඒවත් ලබා දීල ඔවුන්ගේ ආර්ථිකය නංවාලීම තුළින් ඒ බල ප්‍රදේශයෙන් ඔබ්බට ගිහිල්ලා ලංකාව පුරාම එම නව නිපයුම් ප්‍රචලිත කරන්න පුළුවන් නම් ඒක සභාවටත් ගෞරවයක්. ඒ නිසා මම සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා සියලු දෙනාම මැදිහත්වෙලා මේ කටයුත්තට උර දෙන්න කියලා.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

මන්ත්‍රීතුමා අපි දැන් කොට්ඨාසවල නිලධාරීන් ප්‍රශ්නාවලි අරන් ගෙවල්වලට යවනවනේ. ඔය කාරණයත් ප්‍රශ්නාවලියට ඇතුළත් කරල තොරතුරු ලබා ගනිමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**තීරණ අංක 5:4**</u>

බල ප්‍රදේශය තුළ නව නිපැයුම්කරුවන් හඳුනා ගැනීමටත්, වැඩිදියුණු කිරීමටත් තීරණය විය.

<u>**යෝජනා අංක 5:5**</u>

අධිකාරිවිලවත්ත හා අධිකාරිවිලගම මාර්ග පද්ධතිය සභාවට පවරා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදය සාන්ත මහතා

<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>

සභාපතිතුමා සමහර පාරවල් සභාවට අයිතිත් නෑ. නිවාස සංවර්ධන අධිකාරියට අයිතිත් නෑ. එවැනි පාරවල් සභාවට පවරගන්න අවශ්‍ය කටයුතු කරන්න.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

නිවාස සංවර්ධන අධිකාරියට යෝජනාවක් ගේන්න ඕන මේව සභාවට පවරන්න කියලා.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**තීරණ අංක 5:5**</u>

අධිකාරිවිලවත්ත හා අධිකාරිවිලගම මාර්ග පද්ධතිය සභාවට පවරා ගැනීමට තීරණය විය.

<u>**යෝජනා අංක 5:6**</u>

පැරණි ගම්සභා ක්‍රීඩාංගනය සංවර්ධන කිරීමට ටෙන්ඩර් කැඳවීමක් කරන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>

සභාපතිතුමා අපි මේ ළඟදි යනකොටත් එතන මිනිස්සු එකතුවෙලා මත්පැන් පානය කරනවා. ඒක අවට මිනිස්සුන්ට කරදරයක් කියලා ගොඩක් අය කියනවා. සංවිධානය වෙච්ච ඇතැම් පිරිස් එතන ඉන්නවා. පාරෙ මට්ටමට ඒක සකස් කළොත් පාරෙ යන අයට පේන නිසා එතන ඉන්න බෑ. ක්‍රීඩාවට අවශ්‍ය ප්‍රමාණයට ඒ පස් ටික අඩි 03 ක් වත් පහත් කරල ඒ ග්‍රවුන්ඩ් එක හදාගත්තොත් ඉඩ ප්‍රමාණෙත් වැඩි වෙනවා. වෙනත් අවහිරතාත් අඩු වෙනවා. ටෙන්ඩර් කැඳවීමක් කරල මේක කාටහරි ලබා දුන්නොත් ග්‍රවුන්ඩ් එකේ වැඩ කටයුතුත් කෙරෙනවා සභාවට ආදායමකුත් ලැබෙනවා. ඒ නිසා අවශ්‍ය කටයුතු කරන්න කියල සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

මේ ඉඩමෙයි ආදාහනාගාරයේ ඉඩමෙයි දෙකේම පස් කපන්න පුවත්පත් දැන්වීමක් දාමු.

ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා

සභාපතිතුමා මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට ක්‍රීඩාපිටියක් නැති නිසා ගරු මුදල් අමාත්‍ය මංගල සමරවීර මැතිතුමාගේ ලක්ෂ 120 ක මුදලක් අරගෙන ගිය සභාව වෙලාවෙ මේ ග්‍රවුන්ඩ් එක හදන්න හැදුවා. ඒ වෙලාවේ ඒක සංවර්ධනය කරන්න දිස්ත්‍රික් ලේකම් එකේ ටෙන්ඩර් දාලා පුවත්පත් දැන්වීම් දාලා තියෙද්දි මේක සභාවට අයිතියි කියලා සභාවෙන් හදන්න දුන්නෙ නෑ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට තමයි මේ ඉඩම අයිතිවෙලා තිබුණේ. මැනුම් කටයුතු කරන්න අවශ්‍ය දේවල් ඒ වෙලාවෙ කරල අකුරැස්සට යැව්වා. ඒ වෙලාවෙ වට මැනීමකුත් කළා. මේක වට මැනල අපිට භාර දීල ඉවරද ? ඒ අර්බුදයට මොකද වෙලා තියෙන්නෙ කියලා දැනගන්න ඕන. ඒ වගේම මට හිතෙන්නෙ සාගර මන්ත්‍රීතුමා කිව්ව කාරණයට පිට්ටනියට යන පාර පැරණි ගම් සභා කාර්යාලය අයිනෙන් උඩහට දාන්න ඕන. එතකොට ගම්මානයෙන්නෙ ඇතුල්වෙන්නෙ. වෙන තැනකින් ඇතුල්වෙන්න බැරි වෙන්න පාර හැදුවොත් සාර්ථකයි. එතකොට කාටවත් වෙන තැනකින් ඇතුල්වෙන්න බෑ. පැරණි ගම් සභා කාර්යාලය ඉදිරිපිටින් වාහනයක් යන්න එන්න පුළුවන් විදියට පාර දාන්න ඕන.

ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

මන්ත්‍රීතුමා සභාවට ලක්ෂ 120 ක් ආවෙ නෑ. පස් අදින එකලොකු ගැටලුවක් වෙනවා. කවුරු කොහොම කළත් අපේ අධීක්ෂණයක් තියෙන්න ඕන පස් අදින්න. අපිට පස් ගෙනියන්න ඕන තරම් මිනිස්සු ඉන්නවා. ඒ වුණාට විගණන ගැටලු එනවා කොහොමද පස් ඇද්දෙ කියලා. ඒකට සභාව වගකියන්න වෙනවා. අපට ඔහොම එකක් ආවෙ නෑ. අපි දන්නෑ.මේ වෙද්දි මායිම් ටික වෙන් කරල තියෙනවා. තාම මිනින්දෝරුව අපිට ප්ලෑන් දුන්නෙ නෑ.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:6**

පැරණි ගම්සභා ක්‍රීඩාංගනය සංවර්ධන කිරීම සඳහා දැන්වීම් ප්‍රදර්ශනය කර ටෙන්ඩර් කැඳවීමට තීරණය විය.

6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.

**යෝජනා අංක 6:1**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් ගෙවීමේ පදනම මත ඉන්ධන ලබා ගනු ලබන බ්ලූවේ පිලින් ආයතනයේ ඉන්ධන නොමැති අවස්ථාවලදී ලංකා ගමනා මණ්ඩලයට අයත් ඉන්ධන පිරවුම්හල් වලින් ඉන්ධන ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදය සාන්ත මහතා

**තීරණ අංක 6:1**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් ගෙවීමේ පදනම මත ඉන්ධන ලබා ගනු ලබන බ්ලූවේ පිලින් ආයතනයේ ඉන්ධන නොමැති අවස්ථාවලදී ලංකා ගමනා මණ්ඩලයට අයත් ඉන්ධන පිරවුම්හල් වලින් ඉන්ධන ලබා ගැනීමට තීරණය විය.

**යෝජනා අංක 6:2**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් දේපල 2022 වර්ෂයට බදු දීමට දෙවන වරටද ප්‍රාදේශීය වශයෙන් ටෙන්ඩර් කැඳවුව ද ටෙන්ඩරය ලබා නොගත් බැවින් අවම ලංසු මුදල තවදුරටත් සංශෝධනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

| විස්තරය |
|---|
| 01. මාලිම්බඩ පොදු වෙළඳ පොළ |
| 02. මාලිම්බඩ සෙන්ට්‍රල් පාර්ක් ඉඩම ( අවු.03ක් සඳහා ) |
| 03. හොරගොඩ කුරුදු එලදාව ( අවු.03ක් සඳහා ) |
| 04. හොරගොඩ සායන ඉඩම ( අවු.03ක් සඳහා ) |
| 05. ආඳදොළ වත්ත /හොරගොඩ ලිබර්ටි ටෙරන්ස් ඉඩම ( අවු.03ක් සඳහා ) |
| 06. ශාන්තිවත්ත ඉඩම( අවු.03ක් සඳහා ) |
| 07. කඩුකන්න වැලිපිටියගෙවත්ත ඉඩම ( අවු.03ක් සඳහා ) |
| 08. කොබෙයිමලේ හේන ඉඩම |
| 09. වෙබීනියාවත්ත ඉඩම |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:2**

මෙම දේපල තෙවරක් ටෙන්ඩර් කරනු ලැබුවද ඒ සඳහා ගැනුම්කරුවන් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂය සඳහා මාලිම්බඩ පොදු වෙළඳපොළෙහි බදු මුදල් සභාව මගින් එකතු කිරීමටත් අනෙකුත් දේපල ප්‍රජා මණ්ඩලවලට සහ යෞවන සමාජවලට වගාකිරීම සඳහා ලබා දීමටත් තීරණය විය.

**යෝජනා අංක 6:3**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් තෙලිජ්ජවිල පොදු වෙළඳපොලෙහි ටෙන්ඩරය 2022.04.12 දින පිරිනමා ඇති බැවින් සහ එම මාසයේ මුල් දින සඳහා සභාව මගින් බදු එකතු කර ඇති බැවින් ටෙන්ඩර්කරුගේ ඉල්ලීම මත එම මාසයේ ටෙන්ඩර් ගාස්තු සංශෝධනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

මේ ටෙන්ඩරය අරන් තියෙන එච්.ජී.අජිත් කුමාර කියන මහත්මයා අපෙන් ඉල්ලීමක් කරල තියෙනවා ටෙන්ඩර් ගාස්තු සඳහා යම් සහනයක් ලබා දෙන්න කියලා. මොකද ඔහු මේ ටෙන්ඩරය ලබා ගෙන තියෙන්නෙ 2022.04.12. ඒ මාසෙ මුල් දවස් තුනක් සභාවෙන් තමයි බදු එකතු කරල තියෙන්නෙ. එයා ඒ දින තුනත් ඇතුළුව අප්‍රේල් මාසෙට අදාළ මුදල මේ වෙනකොට ගෙවල තියෙන්නෙ. මේ ඉල්ලීම සහ සභාවෙන් බදු එකතු කිරීම හේතුවෙන් මේ

සති තුනට අදාළ ගාස්තුව කපා හැරීමට ආදායම් පරීක්ෂක නිර්දේශයත් ලබා දීල තියෙනවා. මේකට අපි මොකද කරන්නෙ.

<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>

2022/04/11 ඉඳල 2023 ජනවාරි මාසයේ 11 දක්වා ටෙන්ඩරයේ කාල සීමාව දීර්ඝ කරමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:3</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් තෙලිජ්ජවිල පොදු වෙළඳපොලෙහි ටෙන්ඩරය 2022.04.12 දින පිරිනමා ඇති බැවින් සහ එම මාසයේ මුල් දින සඳහා සභාව මගින් බදු එකතු කර ඇති බැවින් ටෙන්ඩරයේ කාල සීමාව 2022/04/11 සිට 2023/01/11 දක්වා දීර්ඝ කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:4</u>**

මුදල් ප්‍රතිපාදන ලැබී මෙතෙක් ඉටුකිරීමට නොහැකි වූ යෝජනා කඩිනමින් අවසන් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදය සාන්ත මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

<u>ගරු මන්ත්‍රී ජී.පී. උදය සාන්ත මහතා</u>

මම මේක දිගින් දිගටම කරපු යෝජනාවක්. ගියවර මහ සභාවටත් ඉදිරිපත් කරා. ඒ සියලු කරුණු හරියට වාර්තා කිරීම සම්බන්ධව ලේකම්තුමියට ස්තුතිවන්ත වෙනවා. මම එදා කිව්වේ ඒකට ක්‍රමවේදයක් සකස් කරන්න කියලා. මොකද අපි දැකපු අඩුපාඩුවක් තමයි අපේ වැඩ අපි කතා කරල කොතරම් කඩිනම් කරගන්න හැදුවත් නිලධාරීන්ගේ යම් යම් ගැටලු මත අපේ වැඩ කරගන්න බැරිවෙලා තියෙනවා. හොරගොඩ එකමුතු මාවත එක් උදාහරණයක්. සභාපතිතුමා, අපි මැදිහත්වෙලා හොරගොඩ එකමුතු මාවත පුළුල් කිරීමක් කළා. ඒකට වාහන සපයන්න වුණේ මට. අදට මාස 10ක් වෙනවා , ඒත් තවමත් ඒ මුදල් ගෙවන්න බැරිවෙලා තියෙනවා. අවස්ථා දෙකකදී මගේ අතින් සල්ලි දීල ඒ මිනිස්සු පිටත් කරන්න වුණා. අපි ඒ තත්ත්වයට පත් වෙන්නෙ මොකටද කියන එක තමයි ප්‍රධාන ගැටලුව. ඒ සාකච්ඡාවේදි කාර්මික නිලධාරීතුමා කිව්වා කිසිම ගැටලුවක් නෑ මැෂින් එකක් හොයාගෙන වැඩ කරන්න. එතුමා ඒක අනුමත කරල දෙන්නම් කියලා. ඒකට එතන හිටිය තව මන්ත්‍රීවරුත් සාක්ෂි දරනවා. එතුමගෙ කීමට තමයි ඒ වැඩේ අපි කරේ. අද වෙනකොට නොයෙකුත් කරුණු ඉදිරිපත් කරල ඒ වැඩේ අවස්ථා කිහිපයක්ම මග ඇරල තියෙනවා. ඇස්තමේන්තු ඉල්ලුවාම මගේ ළඟ තිබුණු ඇස්තමේන්තුව මම දුන්නා. ඒක පිළිගන්න බෑ කිව්වා. සාගර මන්ත්‍රීතුමා මැදිහත්වෙලා තව ඇස්තමේන්තුවක් ගෙනත් දුන්නා. ඒකත් පිළිගන්න බෑ කිව්වා. අද වෙනකන් ඒ ගැටලුව විසඳිලා නෑ.

මම හිතන්නේ සභාවක් විදියට අපි ලියුමක් යැව්වම මාර්ග සංවර්ධන අධිකාරියට එයාල අපිට ඇස්තමේන්තු ලබා දිය යුතුයි. හැබැයි අද වෙනකන් ඒ ඇස්තමේන්තුව අපට ගෙන්න ගන්න බැරිවෙලා තියෙනවා. ඒ වගේම තමයි 2017, 2018 අවුරුදු දෙකේ ලැබිච්ච මුදල් වලින් රුපියල් ලක්ෂ 02 ක මුදලක් ඉතිරිවෙලා තියෙනවා. මාර්ග සංවර්ධනයට තමයි මනෝජ් සිරිසේන මහත්මයාගෙන් ඒ මුදල් ලැබිල තියෙන්නෙ. ඒකට අපි යෝජනාවක් ඉදිරිපත් කරල ඇස්තමේන්තු හදන්න අවස්ථා ගානක් උත්සාහ කළා. ඒ එකක්වත් අද වෙනකන් කරගන්න බැරිවුණා. දැනට තියෙන තත්ත්වය අනුව කර්මාන්තයක් ඉටුකරල මුදල් ගෙවන්න බැරි තත්ත්වයක් උදාවෙලා. ඒ ලැබිච්ච මුදල්වලින් අඩු ගානේ අපිට පාරවල්වල කාණු කපල පස් දාගන්න අවශ්‍ය තැන් ටිකක් තියෙනවා ඒ ටිකවත් කරල ඒ මුදල ඉවර කරල දෙන්න කියන ඉල්ලීම කරන්න තමයි මම මේ යෝජනාව දැම්මේ.

මොකද අපි අවුරුදු 04 ක් ඉඳලත් මේ මුදලින් වැඩ කරගන්න බැරිනම් අපි මෙතෙක් කලක් මොකද කළේ කියල ගැටලුවක් එනවා. ඒ නිසා කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කරල ඒ වැඩ කටයුතු අවසන් කර ගන්න සහයෝගය ලබා දෙන්න කියල ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

මම හැමදාම නිලධාරීන් ආරක්ෂා කරගෙන හිටියා. හැබැයි දැන් බැලුවම මේක සභාවේ අර්බුදකාරී තත්ත්වයක් හදන්න කරපු දෙයක් දෝ කියල ලොකු සැකයක් තියෙනවා. මේව කිව්වට කෙරෙන්නෙ නෑ. මන්ත්‍රීවරු හිතන් ඉන්නෙ මම කරන්නෑ කියලා.

<u>ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා</u>

ගරු සභාපතිතුමනි, ශාන්තිවත්තටත් රුපියල් 50000.00 ක් එක්ක තමයි උදයසාන්ත මන්ත්‍රීතුමා කිව්ව මුදල් එව්වේ. TO මහත්තයගෙන් අවස්ථා කිහිපයකදී මේකට ඇස්තමේන්තු හදල දෙන්න කියල ඉල්ලීම් කළා. ඒ නිසා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා අදාළ විෂය නිලධාරීන් මෙතනට ගෙන්වන්න කියලා. මේ මුදල් තියෙනවද ඒව අරගෙනද බලන්න. මේක කාර්මික නිලධාරී මහතාගෙන් ඉටුවෙන්නෙ නැත්නම් කරුණාකරල ඒකට ගැළපෙන නිලධාරියෙක් මෙහේ නැතිනම් ඒ මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට හරිදීල ඒව කරවන්න. ඒ නිසා ඒ අදාළ විෂය නිලධාරියා දැන් ගෙන්වල, අපට දැන් උත්තර දෙන්න කියල අපි බොහොම කරුණාවෙන් ඉල්ලනවා. නිලධාරීන් අපිව ෆේල් කරනවා නම්, අපි නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගත යුතුයි.

<u>ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා</u>

සභාපතිතුමා, ඇල්ගිරිය හිරුකඩේ අසල පාරට චන්ද්‍රසිරි ගජධීර ඇමතිතුමාගේ ලක්ෂ 2ක් ආවා. පිටිවලහේන පාරට මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා ලක්ෂ දෙකක් දුන්නා. මම හිටපු තාක්ෂණ නිලධාරීතුමාට අවස්ථා කිහිපයකදීම කිව්වා ඇස්තමේන්තු හදන්න කියලා. නමුත් වර්ෂය අවසන් වෙනකන්ම ඇස්තමේන්තු හදාගන්න බැරිවුණා. ඒ ලක්ෂ 04 ට වුණ දෙයක් දන්නෑ. ඒ සල්ලිවලට මොකද වුණේ කියල කියනවනම් හොඳයි.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

සල්ලි වෙන් කරපුවා වියදම් කරල නැත්නම් , පළාත් පාලන ප්‍රතිපාදන පස්සෙ ගන්න පුළුවන්. පාර්ලිමේන්තු ප්‍රතිපාදන දෙසැම්බර් 31 න් පස්සෙ ගන්න බෑ. මෙතන ගැටලුව තියෙන්නෙ සභාපති වුණා කියල මට හැමදේම කරන්න බෑ. යම්කිසි නිලධාරීන්ගේ පසුබෑමක් තියෙනවා. අපි දීර්ඝව සාකච්ඡා කළා මේ ප්‍රශ්නෙට වග කියන්න ඕන කවුද කියලා.

කාරක සභාවක් බවට පත්කිරීමට

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී.උදයසාන්ත මහතා

මහ සභාවක් බවට පත්කිරීමට

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:4</u>**

මුදල් ප්‍රතිපාදන ලැබී මෙතෙක් ඉටුකිරීමට නොහැකි වූ යෝජනා කඩිනමින් අවසන් කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:5</u>**

ඇල්ගිරිය කොට්ඨාසයේ ඇල්ගිරිය ග්‍රාම නිලධාරී වසමේ බිබුල කඩේ අසල සිට නැදුරුගොඩ දක්වා මාර්ගයේ වලවල් හැරී පයින් ගමන් කිරීමටවත් නොහැකි තත්ත්වයට පත්ව ඇත. මෙම පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:5</u>**

ඇල්ගිරිය කොට්ඨාසයේ ඇල්ගිරිය ග්‍රාම නිලධාරී වසමේ බිබුල කඩේ අසල සිට නැදුරුගොඩ දක්වා මාර්ගයේ වලවල් හැරී පයින් ගමන් කිරීමටවත් නොහැකි තත්ත්වයට පත්ව ඇති බැවින් මෙම පාර කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:6</u>**

ඇල්ගිරිය වාසනා හාල් මෝල අසල සිට පහලපිටිවලහේන දක්වා පාර ගිලා බැස වැසි දිනවලදී ගමන් කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති බැවින් දින දෙකක් ශ්‍රම දානයක් කර පස් දැමීමට බැකෝ යන්ත්‍රයක් සහ ට්‍රැක්ටර් තුනක් ලබාදීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:6</u>**

ඇල්ගිරිය වාසනා හාල් මෝල අසල සිට පහලපිටිවලහේන දක්වා පාර ගිලා බැස වැසි දිනවලදී ගමන් කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති බැවින් දින දෙකක් ශ්‍රම දානයක් කර පස් දැමීමට බැකෝ යන්ත්‍රයක් සහ ට්‍රැක්ටර් තුනක් ලබා දීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:7</u>**

කාබනික පොහොර ඒකකයේ වැඩ කරන පිරිස්, ප්‍රාදේශීය සභාවේ ඒ සඳහා සම්බන්ධවී වැඩ කටයුතු කරන නිලධාරීන් හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා බලංගොඩ කොම්පෝස්ට් ඒකකය නැරඹීමට ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව යාම සඳහා අවශ්‍ය බස් රථය වෙනුවෙන් රු.70000.00 ක මුදලක් ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:7</u>**
කාබනික පොහොර ඒකකයේ වැඩ කරන පිරිස්, ප්‍රාදේශීය සභාවේ ඒ සඳහා සම්බන්ධවී වැඩ කටයුතු කරන නිලධාරීන් හා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා බලංගොඩ කොම්පෝස්ට් ඒකකය නැරඹීමට ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව යාම සඳහා අවශ්‍ය බස් රථය වෙනුවෙන් රු.70000.00 ක මුදලක් ලබා දීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:8</u>**
**<u>ප්‍රාදේශීය සභා රැස්වීම් කාර්යය පටිපාටියේ 11(5) අනුව 2022/04/07 වන දින පැවති මහා සභාවේ අංක 5.7 යෝජනාව පරිච්ඡින්න කිරීම සඳහා වූ පහත සඳහන් යෝජනාව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති විසින් ගරු උප සභාපති,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වසන්ත මුණසිංහ, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නාලක යන සභිකයින් හතර දෙනාගේ අත්සන් සහිතව ඉදිරිපත් කිරීම.</u>**

ඉන්ධන මිළ සීඝ්‍ර ලෙස ඉහලයාම හේතුවෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීමේදී පැයක් සඳහා අයකරන ගාස්තුව රු.3800.00 සිට රු.5200.00දක්වා වැඩි කිරීමටත්, ජේ.සී.බී. යන්ත්‍රය වෙන් කරන කාලය පැය 04 කට අඩුනම් සහ දුර ප්‍රමාණය 5km වැඩිනම් ගමන ආරම්භ කළ ස්ථානයේ සිට මීටරය ගණනය කිරීමටත් ගරු සභාවට යෝජනා කරමු.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:8</u>**
ඉන්ධන මිළ සීඝ්‍ර ලෙස ඉහලයාම හේතුවෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීමේදී පැයක් සඳහා අයකරන ගාස්තුව රු.3800.00 සිට රු.5200.00 දක්වා වැඩි කිරීමටත්, ජේ.සී.බී. යන්ත්‍රය වෙන් කරන කාලය පැය 04 කට අඩුනම් සහ දුර ප්‍රමාණය 5km වැඩිනම් ගමන ආරම්භ කළ ස්ථානයේ සිට මීටරය ගණනය කිරීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 6:9</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මගින් ආරම්භ කරන ගෙවතු වගා වැඩසටහන යටතේ නිෂ්පාදනය කරන ද්‍රව්‍ය සහ කාබනික පොහොර අලෙවි කිරීම සඳහා මාලිම්බඩ කඩ සංකීර්ණය ඉදිරිපිට අලෙවි කුටියක් ඉදිකිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:9</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මගින් ආරම්භ කරන ගෙවතු වගා වැඩසටහන යටතේ නිෂ්පාදනය කරන ද්‍රව්‍ය සහ කාබනික පොහොර අලෙවි කිරීම සඳහා මාලිම්බඩ කඩ සංකීර්ණය ඉදිරිපිට අලෙවි කුටියක් ඉදිකිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:10**

ගල්ඇන්දකුට්ටිය ප්‍රධාන මාර්ගය ගමන් කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති බැවින් ABC යොදා සංවර්ධනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:10**

ගල්ඇන්දකුට්ටිය ප්‍රධාන මාර්ගය ගමන් කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති බැවින් ABC යොදා සංවර්ධනය කිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:11**

2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන පහත පුස්තකාල වැඩසටහන් ගරු සභාවට ඉදිරිපත් කරමි.

| වැඩසටහන් විස්තරය | ඇස්තමේන්තු ගත මුදල |
|---|---|
| කතන්දර පැය වැඩසටහන | 4000.00 |
| එළිමහන් පුස්තකාලය නිර්මාණය කිරීම | 15000.00 |
| කියවීමේ කඳවුර | 40000.00 |
| ගීත රසවින්දන වැඩසටහන | 7000.00 |
| ඩිවි දශම වර්ගීකරණය අනුව පාසල් පුස්තකාල සකස්කර දීම | - |
| සාහිත්‍ය තරඟාවලිය | 30000.00 |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

**ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා**

සභාපතිතුමා එළිමහන් පුස්තකාලය නිර්මාණය කිරීමේදී අපි පුටු මිළදී ගැනීමක් නොකර ආරම්භයක් විදියට පුස්තකාලේ තියෙන පුටු යොදා ගනිමු. සාර්ථක වුණොත් කොන්ක්‍රීට් පුටු ගනිමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:11**

2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන පහත පුස්තකාල වැඩසටහන් අනුමත කිරීමටත් එහිදී එළිමහන් පුස්තකාලය සඳහා දැනට පුස්තකාලයේ තිබෙන අතිරේක පුටු යොදාගැනීමටත් තීරණය විය.

**යෝජනා අංක 6:12**

තෙලිජ්ජවිල පොළ පැවැත්වෙන දිනවලදී මාලිම්බඩ පුස්තකාල භූමිය තුළ වාහන නවතා තබන පුද්ගලයන්ගෙන් රථගාල් ගාස්තුවක් අය කිරීමටත්, ඒ සඳහා ටිකට්පතක් මුද්‍රණය කර ලබා දීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:12</u>**

තෙලිජ්ජවිල පොළ පැවැත්වෙන දිනවලදී මාලිම්බඩ පුස්තකාල භූමිය තුළ වාහන නවතා තබන පුද්ගලයන්ගෙන් රථගාල් ගාස්තුවක් අය කිරීමටත්, ඒ සඳහා ටිකට්පතක් මුද්‍රණය කර ලබා දීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 6:13</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත රියදුරෙකු ලෙස සේවය කරන ඊ.එල්.මධුර දීපික මහතාගේ සේවා කාලය වසරකින් දීර්ඝ කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:13</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත රියදුරෙකු ලෙස සේවය කරන ඊ.එල්.මධුර දීපික මහතාගේ සේවා කාලය වසරකින් දීර්ඝ කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 6:14</u>**

**<u>ප්‍රාදේශීය සභා රැස්වීම් කාර්යය පටිපාටියේ 11(5) අනුව 2022/04/07 වන දින පැවති මහා සභාවේ අංක 5.3 යෝජනාවේ අංක vi,vii,viii,ix,x පරිච්ඡින්න කිරීම සඳහා වූ පහත සඳහන් යෝජනාව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති විසින් ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ, ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා, ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නාලක යන සභිකයින් හය දෙනාගේ අත්සන් සහිතව ඉදිරිපත් කිරීම.</u>**

ගම සමග පිළිසඳර වැඩසටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලක් ලබාගෙන ප්‍රජාශාලා ඉදිකිරීමට අනුමත වූ යෝජනාව පහත සහන් අකාරයට වෙනස් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

I. ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ කැකුණවෙල ප්‍රජා ශාලාව ඉදිකිරීම.
II. ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ වෙළෙඳගොඩ ප්‍රජා ශාලාව ඉදිකිරීම.
III. ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ නාගොඩ ගල්ගොඩවත්ත ඉඩමේ ප්‍රජා ශාලාව ඉදිකිරීම.
IV. ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ නාගොඩ අකුරුගොඩ ශාන්තිවත්ත ඉඩමේ ප්‍රජා ශාලාව ඉදිකිරීම.

V. ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ මාරගහහේන ප්‍රජා ශාලාව ඉදිකිරීම

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:14</u>**

ගම සමග පිළිසඳර වැඩසටහන යටතේ 2022 වර්ෂයේ අනුමත වූ රුපියල් ලක්ෂ 12 ක මුදලක් ලබාගෙන ප්‍රජාශාලා ඉදිකිරීමට අනුමත වූ යෝජනාව පහත සහන් අකාරයට වෙනස් කිරීමට තීරණය විය.

I ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ කැකුණවෙල ප්‍රජා ශාලාව ඉදිකිරීම.

II ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ වෙළෙඳගොඩ ප්‍රජා ශාලාව ඉදිකිරීම.

III ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ නාගොඩ ගල්ගොඩවත්ත ඉඩමේ ප්‍රජා ශාලාව ඉදිකිරීම.

IV ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ නාගොඩ අකුරුගොඩ ශාන්තිවත්ත ඉඩමේ ප්‍රජා ශාලාව ඉදිකිරීම.

V ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යටතේ මාරගහහේන ප්‍රජා ශාලාව ඉදිකිරීම

**7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

- මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු දේපල බදුදීම සඳහා වූ ප්‍රාදේශීය ටෙන්ඩර් කැඳවීම 2022.04.11 දින පැවැත්වූ අතර එම කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම.

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

**9). වෙනත් කරුණු.**

<u>ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා</u>

අපේ වසන්ත මුණසිංහ මහතාගේ තාත්තා පසුගිය දවසේ මිය පරලොව ගියා. විශේෂයෙන් එතුමා අපිත් එක්ක බොහොම ළඟින් කටයුතු කරපු සමාජ සේවකයෙක්. ඒ වගේම බොහොම නිහතමානී සරල මනුෂ්‍යයෙක්. අපේ සභාපතිතුමා ප්‍රමුඛ සෙසු මන්ත්‍රීතමන්ලා ලේකම්තුමිය ප්‍රමුඛ සහභාගිවෙන්න පුළුවන් නිලධාරීනුත්, ඒ අවස්ථාවට සහභාගී වුණා. ඒ අභාග්‍ය සම්පන්න අවස්ථාව උදාවුණු වෙලාවෙ ඉඳලා ඉඩ ලැබුණු මොහොතේ සිට සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු වසන්ත මන්ත්‍රීතුමා සමග දුක බෙදා ගන්න කටයුතු කළා. මේ වෙලාවේ මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සියලු දෙනාගේ සාතිශය සංවේගය වසන්ත මන්ත්‍රීතුමා, එතුමාගේ මැණියන් ප්‍රමුඛ පවුලේ අයට පුද කරන බව මතක් කරනවා.

ඒ වගේම ඊළඟ කාරණාව තමයි ගරු සභාපතිතුමනි, අපේ සභාවේ නිලධාරීන් වැඩිවෙමින් පවතිනවා. එබැවින් ඉඩකඩ නොමැතිකමක් අපට පේනවා. එහෙම වෙලාවක් තුළ උප කාර්යාලයකට යාමට සුදුසුම අවස්ථාවක් ලෙස මම මේ මොහොත දකිනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා තෙලිජ්ජවිල මහජන පුස්තකාලයේ පහල මාලය අරගෙන මාලිම්බඩ

ප්‍රාදේශීය සභා කාර්යාලයේ උප කාර්යාලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන හැටියට. ඒ වගේම මේ යෝජනාව බොහොම ඉක්මනින් ක්‍රියාත්මක වනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම මේ කාලය තුළ අපට ඉටුකරන්න බැරිවෙච්ච ජනතා අපේක්ෂාවන් රාශියක් තියෙනවා. විශේෂයෙන් මංමාවත්වලට ඒක පොදුකාරණාවක් වුණා. හැම මන්ත්‍රීවරයෙක්ම කතාකළොත් කතා කරන්නෙ තමන්ගෙ බල ප්‍රදේශයේ පාරවල් පිළිබඳව. මටත් ඒක පොදු කාරණයක්. මටත් කිලෝමීටර් 2 ක විතර දුරක් කන්දක යන්න තියෙනවා. අපේ පාර හදාගන්න මටත් බැරිවුණා. ඒකනම් සදර්න් ගෲප් කියන කම්පැනියෙ වරදින් තමයි සිදුවුණේ. නඩුවක් යන්න පුළුවන්නම් නඩුවක් යා යුතුයි. පාරවල් 10 ක් සඳහා ගිවිසුම් අත්සන් කරල පාරවල් නොකෙරෙන පරිදි කටයුතු කළේ ඒ ආයතනය. ගිවිසුම් අත්සන් කළ අනෙක් ආයතන ලහිලහියේ ඒ කටයුතු කළා. ඒ නිසා වර්තමානයේ පත්වන රජයෙන් ඉල්ලීමක් කරනවා මේ සදර්න් ගෲප් ආයතනයටත් , ඉහළින් ඉඳගෙන ඒ ආයතනයට ටෙන්ඩර් පටිපාටියකින් තොරව කවුරු හරි කොන්ත්‍රාත් දුන්නනම් එයාලටත් විරුද්ධව  කටයුතු කරන්න කියලා.

ඒ වගේම සභාපතිතුමනි, අකුරුගොඩ ගමගෙවත්ත පාර යන්න එන්න බැරි තත්ත්වයක තියෙන්නෙ. ඒ පාර ප්‍රදේශයේ ජනතාව බහුලවම භාවිතා කරන පාරක්. නාගොඩ පාරට ඉතා ආසන්නයේ කෙටි මාර්ගයක් ලෙස පවතින්නේ. අඩුම තරමේ ඩෝසරයක් දාලා කාණු ටික කපලා ABC  දාලා දෙන්න කියල ඉල්ලීමක් කරනවා. එක තැනක් තියෙනවා අඩුම තරමේ බයිසිකලයක්වත් යන්න නොහැකි. සභාපතිතුමා අවස්ථා කිහිපයකදී එම ස්ථානය නිරීක්ෂණය කළා. මේ වෙලාවේ ඒ පාර යාමට සුදුසු තත්ත්වයට සකස් කරල දෙන්න කියල ඉල්ලනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

උපසභාපතිතුමා ඔබතුමා ඉදිරිපත් කළ උප කාර්යාලය සම්බන්ධ යෝජනාව ඉදිරි සභාවට යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන්න.

<u>ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය</u>

එක්සත් ජාතික පක්ෂ නායක වත්මන් අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සුභාශිංශන ගෙන එන්න තමයි මම මේක අවස්ථාවක් කර ගන්නෙ. එමෙන්ම රටේ පවතින අර්බුදකාරී තත්වය දරාගත නොහැකිව ප්‍රජාත්‍රන්ත්‍රවාදීව ගෝලේෆ්ස්පිටියේ සිදුකරන අරගලයේ අරගලකරුවන්ට සිදුවුණු ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රහාරයට බලවත් අප්‍රසාදය මා මේ මොහොතේ පල කරනවා. ඒ වගේම අරගලයට මුවාවී සිදුකරනු ලබන අවස්ථාවදී දේශපාලන කටයුතු සඳහා ද බලවත් අප්‍රසාදය මා පලකර සිටිනවා. ඒ වගේම සභාපතිතුමනි, මා මාගේ මාලිම්බඩ ජනතාවට විශේෂ ස්තුතියක් කරන්න ඕන මේ අවස්ථාවේ. ඒ මොකද අවස්ථාවාදීත්වය පලිහක් කර නොගෙන, දේශපාලන පලිගැනීම් වලට ලක් නොකර, බුද්ධිමත්ව සිතා බලා කටයුතු කිරීම පිළිබඳව මාගේ හෘදයාංගම ස්තුතිය මා මේ මොහොතේ ප්‍රකාශ කර සිටිනවා.

ඒ වගේම ඉදිරිකාලය තුළදී වර්තමාන අග්‍රාමාත්‍යතුමාගේ දැක්ම සහ වැඩපිළිවෙළ විශ්වාස කර, දේශපාලන උසිගැන්වීමවලට හසුනොවී, කරගෙන යන කාර්යයන්ට බාධාවක් නොවී, ඉදිරි කාලයද එකාවන්ව අපේ ප්‍රදේශයේ සාමකාමීත්වය පැතිරෙන විදියට අපි සියල්ලක්ම කටයුතු කරමු යැයි මම යෝජනා කරනවා.

ඒ වගේම සභාපතිතුමනි, මන්ත්‍රීවරියක් විදියට අද  මට මෙහෙම කතා කරන්න හැකියාව ලැබුණේ එතුමාගේ පවතින ප්‍රජාතන්ත්‍රවාදී  දේශපාලන දැක්මේ ප්‍රතිඵලයක් ලෙස පළාත් පාලන ආයතන තුළ ඇති කරනු ලැබූ 25% ක කාන්තා නියෝජන ක්‍රමය නිසා. ඒ පිළිබඳව මම එතුමාට ස්තුති පූර්වක වෙනවා. වර්තමාන ජනාධිපතිතුමා රටේ දේශපාලන ප්‍රවාහයන් වෙත

රටේ පාලන බලය භාර ගැනීමට ආරාධනා කර තිබූ මොහොතක සියලු පාර්ශව කොන්දේසි දමමින් කඹ අදිමින් සිටියදී  මේ එවන් දෙයකට සුදුසු වෙලාවක් නොවන නිසා රටේ මහජනතාවට ඉතා සුළු කාලයක් තුළ මුහුණ පෑමට සිදුව ඇති අර්බුදකාරී තත්ත්වයෙන් මුදවා ගැනීමට එතුමා ඉදිරිපත් වුණා. මෙවන් නිර්භය පුද්ගලයෙකු මාගේ පක්ෂයේ සහ මාගේ නායකයා වීම පිළිබඳව අතිශයින් සතුටු වෙනවා. ඒ වගේම එතුමා මේ ගෙනයන වැඩ පිළිවෙළ ඉදිරියට කරගෙන යාමට හැකිවේවායි ආශිර්වාද කරන අතරම මෙතෙක් ආ එක්සත් ජාතික පක්ෂයේ දුෂ්කර ගමන් මග තුළ මා සැබෑ එක්සත් ජාතික පාක්ෂිකයෙකු වූවා සේම, ඉදිරි කාලය තුළදී පක්ෂයට බලය ඇති හෝ නැති වුවද මා සැබෑ එක්සත් ජාතික පාක්ෂිකයෙකු වශයෙන් කටයුතු කරනවා  යයි කියමින් මා මෙය අවසන් කරමි.

<u>ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා</u>

අපි අවුරුදු හතරක් මන්ත්‍රී ධූරයේ හිටියා. මන්ත්‍රීවරයෙකු ලෙස ජනතාව පත්කරල එව්වා. ඇත්තටම මගේ මන්ත්‍රී වැටුප පරිත්‍යාග කරල මට පුලුවන් උපරිම ආකාරයට ජනතාව වෙනුවෙන් වැඩ කරල තියෙනවා. ඉතින් නැවත ඡන්දය ඉල්ලන්න වුවමනාවකුත් නෑ කියල අපේක්ෂාවක් තියෙනවා. අපිට සමාජය වෙනුවෙන් උපරිම දේ කරන්න කැප කිරීම් ගොඩක් කරන්න අමාරුයි. මේ දේශපාලනයට පැමිණීම හේතුවෙන් මගේ ව්‍යාපාර කටයුතු අවුල් වෙලා තියෙනවා. මම ප්‍රදේශයේ මාව පත්කරල එවපු ජනතාවට ගෞරවයක් වන ආකාරයට මන්ත්‍රී ධූරයේ කටයුතු කළා. ජනතා  සේවකයෙක් ලෙස පත්කර එවීමේ ගෞරවය මා රැක්කා. ඇත්තටම ඒ ජනතාවට මට ආයෙ සේවයක් කරන්න හැකියාවක් තියෙයිද නැද්ද කියන්න බෑ. මම ප්‍රදේශයේ ජනතාවට ස්තුතිවන්ත වෙනවා මාව පත් කරල එව්වට.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

අවුරුද්දක් දක්වා සභා කාල සීමාව දීර්ඝ කරල තියෙනවා. ඒ අවුරුද්දෙන් පස්සෙ කොමසාරිස් පාලනයට යයි. අපි දැනගත්ත හැටියට එහෙමයි වෙන්නෙ.

<u>ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා</u>

පසුගිය දවස්වල මගේ පියාගේ අභාවය වුණ අවස්ථාවේ මම අපේ උප සභාපතිතුමාට හා සභාපතිතුමාට කතා කරල දැනුම් දුන්නා. මම ගෙදරට යනවිට සභාපතිතුමාත්, උප සභාපතිතුමාත් මගේ නිවසට ඇවිල්ලා තිබුණා. ඒ වෙලාවේ මම මානසික වශයෙන් අපහසුතාවයකට පත්වෙලා හිටියේ. ඒ වෙලාවේ මට ශක්තියක් වෙන්න සභාපතිතුමාත්, උප සභාපතිතුමාත් මගේ පස්සෙන් ඉඳගෙන ඒ වැඩ කටයුතු නිවැරදිව සිදු කරන්න උපදෙස් දීල ඒ ශක්තිය මට දුන්නා. මුලින්ම මම ඒ දෙපලට ගොඩක් ස්තුතිවන්ත වෙනවා. අපේ උප සභාපතිතුමා මට විතරක් නෙමෙයි ගමේ හැමෝටම වගේ ඒ ඒ අවස්ථාවල ගිහින් පුදුමාකාර සේවයක් කරනවා. පෞද්ගලිකව අපිට මන්ත්‍රීවරුන් හැටියට එතුමා කරන සේවය කරන්න බැහැ. සභාවේ ලේකම්තුමිය ඇතුළු ඒ නිලධාරීතුමන්ලා, තුමියන්ලා ඒ අවස්ථාවට සහභාගී වුණා. එම කාර්යය මණ්ඩලයටත් මම ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම සහෝදර මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා මාත් එක්ක ඒ වෙලාවේ මගේ ළඟින්ම හයියක් විදියට හිටියා. ඒ සියලු දෙනාටම මම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමා,  මේ පාරවල් ගැන  අපි කතා කරනවා. අද වෙනකොට අපි යෝජනා කරපු අපි හිතාගෙන හිටපු පාරවල් සංවර්ධනය කරන්න අපහසු තත්ත්වයක අපි ඉන්නවා. දැනට අපි කාපට් ව්‍යාපෘතිය කරන්න යෝජනා කරපු පාරවල්වල බයිසිකලයකින්වත්, මෝටර් සයිකලයකින්වත් යන්න බැරි තත්ත්වයට පත්වෙලා තියෙනවා. මැදගොඩ පාර, කපුහේන වගේ පාරවල් උදාහරණ විදියට දක්වන්න පුළුවන්. මිනිස්සු විශාල දෝෂාරෝපණයකට ලක් කරනවා. මොකද අපි ලොකු බලාපොරොත්තුවක් ඒ අයට දුන්නා අමතර මුදලක් වැයකරල ඒවායේ සංවර්ධන කටයුතු කරන්න ඕන නෑ , අපි එක සැරේ කාපට් ව්‍යාපෘති ක්‍රියාත්මක කරමු  කියලා. මේ රටේ අර්බුද එක්ක මට නම් පේන තෙක් මානයක

එහෙම වැඩසටහනකට යන්න පුලුවන් කියල හිතෙන්නෑ. ඒ නිසා ගරු සභාපතිතුමා මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේ පාරවල් ටික දෙපැත්තෙ කාණුටික කපලා, ජලය බැහැල යන්න පුලුවන් ආකාරයට හදල, පස් ටිකක් හරි දාලා ඒක තලලා, යන්න පුළුවන් ආකාරයට හදල දෙන්න ඕන. නැත්නම් අපි ලොකු ප්‍රශ්නයකට භාජනය වෙනවා. මහජනතාවගේ අප්‍රසාදයට ලක්වෙනවා. මොකද මේ දවස්වල විවිධ දේශපාලන පක්ෂ විවිධ දේශපාලන අර්බුදවල යෙදෙනවා. වාසනාවකට වගේ මාලිම්බඩ ප්‍රාදේශීය සභාව බේරවැවේ බැස්සෙ නෑ. විශේෂයෙන් අපේ ආසන සංවිධායකතුමා සහ මන්ත්‍රීවරු කලින් ඉඳල පොඩි පසුබෑමක් තිබුණා. මොකද අපි හැමදාම හිටියෙ ජනතාවගේ පැත්තෙ. අපි තමයි පොළොවෙ පය ගහල මේ ගමේ හැම මිනිස් ජීවිත එක්කම ළඟින්ම ඇසුරු කරන උදවිය. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු විදියට ගමේ තියෙන ප්‍රශ්න අපි තමයි දන්නෙ. ගමේදි අපි එදා ඉඳන්ම හිටියෙ ගමේ අය එක්ක. ඒ නිසා අපි ඒ ප්‍රශ්න දිහා බැලුවෙ පක්ෂ පාට භේදවලින් තොරව. පක්ෂය තුළ සාධාරණ විදියට හිටගත්ත නිසා බේරවැවේ නාන්න වුණේ නෑ. නැත්නම් අපට එන්න කිව්වම ගමේ අයත් එකතු කරගෙන බස් එකේ නැගල යනවා. මැයි පෙළපාලි වැනි වෙනත් සියලු රැස්වීම්වලට අපි යනවා. නමුත් මේ වැඩසටහනේදි අපි පොඩි පසුබෑමකට ලක් වුණා. මොකද අපි ඩීසල් පෝලිම්, පෙට්‍රල් පෝලිම් , ගෑස් පෝලිම් ප්‍රායෝගිකව අත්වින්දා. මේ ප්‍රශ්නෙ තේරුම් අරන් තමයි අපි පසුබෑමක් වුණේ. ඒ නිසා මම ඔබතුමාගෙන් නැවත වරක් ඉල්ලන්නෙ අපිට පුලුවන් ආකාරයෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මන්ත්‍රීවරු පාට පක්ෂ භේදයකින් තොරව ජනතාව වෙනුවෙන් ඉදිරිපත් වෙමු කියලා.

ඒ වගේම සමහර ජනතාව ගොඩක් උත්සාහ ගත්ත සභාපතිතුමා ප්‍රහාරයට ලක් කරන්න. නමුත් මාලිම්බඩ ජනතාව ඒවට අහුවුණේ නෑ. මොන පක්ෂ පාට තිබුණත් පුලුවන් ආකාරයෙන් අපි අපේ මන්ත්‍රීවරු ආරක්ෂා කරන්න කැප වෙනවා. ගමේ මිනිස්සු අපිට ගහන්න , ගෙවල් ගිනිතියන්න ආවෙ නෑ කවදාවත්. නමුත් වෙනත් දේශපාලන බලපෑම්වලට, අරමුණුවලට සම්බන්ධ වෙච්ච පිරිස් පිට පළාත්වලින් එනවා. මේ ප්‍රශ්නෙත් එක්ක මෙහෙත් කෝප වෙච්ච පිරිස් මේ අය එක්ක එකතුවෙලා තමයි මේ වැඩසටහන් කළේ. ඒ නිසා විශේෂයෙන් මාලිම්බඩ බල ප්‍රදේශය තුළ ජීවත්වන සමස්ත ජනතාවට හිස නමා ආචාර කරනවා, ස්තුතිවන්ත වෙනවා එහෙම තීරණයකට නොයාම පිළිබඳව. අභිමානයෙන් යුතු මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු හැටියට මේ බැඳීම, මේ එකමුතුකම පක්ෂ පාට භේදයකින් තොරව අපි හැමදාම තියාගමු කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>**

වසන්ත මන්ත්‍රීතුමා ඇතුළු පවුලේ සියලු දෙනාටම අපි අපේ බලවත් ශෝකය ප්‍රකාශ කරනවා. රට ගැන අපි කතා කරන කොට ඉතාම බැරෑරුම් අවස්ථාවක්. ඒ වගේම ඉතාම දුෂ්කර සහ දුක්බර අවස්ථාවක් සමස්ත ලංකාවෙම ජනතාවට. එක්කෙනෙකුට දෙන්නෙකුට නෙමෙයි සෑම දෙනාටම ඉතාම අසීරු, සෑම අංශයක්ම ඉතාම පහතට වැටුණු මොහොතක්. සාමාන්‍ය පෙළ විභාගය කරන ළමයි ලොකු අසීරුතාවයකට පත්වෙලා තියෙනවා. එක පැත්තකින් විදුලිය නොමැතිවීම නිසා, නැත්නම් ඇඳිරිනීතිය දැමීම නිසා තමන්ගේ අධ්‍යාපන කටයුතු කරගන්න බැරිව අධ්‍යයන කටයුතු ඉතාම පහල මට්ටමකට වැටිල තියෙනවා. මේ රටේ මේ කාලෙ මේ වගේ ප්‍රශ්නයක් තිබුණා. ඒ නිසා එකවර සමත් වෙන්න බැරි වුණා කියල කවදාවත් සහතිකයක ලියන්නෙ නෑ. ඒ නිසා ඒ ළමයි සදාකාලිකවම දුක් විඳින්න පුලුවන්. අපි සමාව ඉල්ලන්න වෙනවා රටේ අහිංසක දූ දරුවන්ට අධ්‍යාපනයක් ලබා දීමට නොහැකිවීම පිළිබඳව. ඒ වගේම මගුල් ගෙයක් , දානෙ ගෙයක් තමන්ට ඕන ආකාරයට පවත්වා ගන්න බැරි වෙලා තියෙනවා මේ තෙල් ප්‍රශ්න නිසා. ගෑස් ගැටලුව, අධික බඩුමිල, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය නොමැතිවීම නිසා මිනිස්සු අසරණ වෙලා. විදුලිය නැති වුණාම නැවත විදුලිය එනකම් ස.තො.ස. ළඟ මිනිස්සු දරුවො සමඟ අව්වෙ වැස්සෙ දුක් විඳිනවා. එවැනි තත්වයක් ආපේ රටට උදා වෙලා තියෙනවා. මේ සියල්ල අතරේ රජයේ ලොකු කැලඹීමක් ඇති වෙලා රටේ තරුණ පිරිස් හෝ වැඩිහිටියෝ අතරේ ප්‍රශ්න ඇති වෙලා. මං හිතන්නෙ ඒවායෙනුත් තවත් අය අයුතු ප්‍රයෝජන

අරගෙන හොර හතුරො බිහිවෙලා. රට අනිත් පැත්තට හැරෙන වෙලාවේ එක්සත් ජාතික පක්ෂ නායකයා හැටියට රනිල් වික්‍රමසිංහ මැතිතුමා සියලු දෙනා ගැන හිතලා එතෙන්ට ගිහිල්ලා තියෙනවා. ලොකු ගෞරවයක් එතුමාට සහ මුලු රටේම ජනතාවට.
අද අපේ ගම ගත්තම පාරවල් වල දැන් යන්න බැරි තත්ත්වයක තියෙන්නෙ. කාණු බාගෙට හදලා, නැත්නම් පාරවල් හදන්න ගියපුවා හෝදගෙන ගිහින් යන්න බැරි තත්වයක තියෙන්නේ. සභාවක් හැටියට අපි ඉස්සර වෙලා කතා කළා වගේම මේ මිනිස්සුන්ට පා පැදියක හෝ පයින්වත් යා හැකිවන ආකාරයට සංවර්ධන කරදීම අපේ යුතුකමක් ලෙස මම දකිනවා. නව වැඩ පටන් ගන්න ප්‍රථමයෙන්, ඒ කරපු වැඩ ටික නිම කිරීම ඉතාම වැදගත් වෙයි කියලා මම ප්‍රකාශ කරනවා. ඒ වගේම මේ ව්‍යාපෘති වලට සම්බන්ධ වෙලා කොන්ත්‍රාත්කරුවන් හැටියට ඉන්න කීප දෙනෙක් අපිට කියනවා අපි කනකර උකස් තියල තමයි මේ ව්‍යාපෘති කලේ අපිට මුදල් ලැබිල නෑ කියල. එයාලා ඒවා රැකියාවක් හැටියට කළා නම් කම්කරුවන්ට වේතන ගෙවන්න ඕන. ඒ මිනිස්සු ණය වෙලා තියෙනවා. ඒ මිනිස්සුත් අසරණ වෙලා තියෙනවා. ඒ ප්‍රශ්නයත් අපි සභාවක් විදියට විසඳන්න කටයුතු කරන්න ඕන. හැම කෙනෙක්ගෙම ගැටලු විසඳීම තමයි මහජන නියෝජිතයෙක් හැටියට කරන්න ඕන. ඒ නිසා මේ අවස්ථාවේ සියලු දෙනාගෙම එකමුතු කමින් මේ ගමන යන්න ඕන කියල කියනවා. සියලු පක්ෂ පාට භේද, ආගම්, කුල භේද පැත්තකට දාලා රට වෙනුවෙන් හිතලා ඉවසීම් සියල්ල කරල රටේ ජනතාව කුපිත වෙලා ඉන්න මොහොතේ මාලිම්බඩ ජනතාව ඉතා නිහතමානි ලෙස හැසිරෙනවා අපි දැක්කා. රටේ මොන කැලඹීම ඇති වුනත් ඔවුන් නිහතමානිව කටයුතු කළා. විපක්ෂය හැටියට අපි සියලු දෙනාටම ප්‍රේම කරනවා මිසක් වෛර කරන අය නොවෙයි. ඒ නිසා අපේ සභාව තුල එහෙම දෙයක් වුනේ නෑ. ඒකේ ගෞරවය සියලුම මන්ත්‍රීවරුන්ට හා ප්‍රදේශයේ ජනතාවට ලබා දෙන්න ඕන. මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඕනෑම අවස්ථාවකදී එකාවන්ව වැඩ කරන , ඒ වගේම පක්ෂ පාට භේද අමතක කරල හදිසි විපතකදී කටයුතු කරන අය හැටියට ඒකෙ ගෞරවය මාලිම්බඩ ජනතාවට ලැබෙන්න ඕන කියල කියමින්, ඉදිරි සංවර්ධන වැඩවලදී ඉතා කඩිනමින් සංවර්ධන කටයුතුත්, මේ පෝලිම් අවසන් වෙලා එදා තිබුන වගේ රට යථා තත්ත්වයට පත්කරන්න වාසනාව ලැබන්න කියල අපි ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා</u>

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මීට පෙර මන්ත්‍රීවරු කිහිපදෙනෙක් මතුකළ කාරණයක් පිළිබඳව වචන කිහිපයක් කතා කරන්න ඕන කියලා හිතුණා. දේශපාලන ඉතිහාසයට නපුරු කළු පැල්ලමක් එක් කළ, දේශපාලනයේ ක්‍රෝධය වෛරය ද්වේශය වපුරපු, රටටම අඳුරු විනාශකාරී දිනයක් බවට පසුගිය මැයි 09 වෙනිද පත් වුණා. 1988/89 න් පස්සෙ එක් දිනයක් තුළ වැඩිම ජීවිත ගානක් අහිමි කරල වැඩිම දේපල ප්‍රමාණයක් විනාශ කරපු, 300 ට ආසන්න පිරිසක් තුවාලකරුවො කරපු මේ අමානුෂික සිද්ධිය මේ රටේ දේශපාලනයට එල්ල වුණු මරු පහරක්. මේ දවස ගැන කතා කරන්න හිතුවෙ එදා ඉලක්කයක් බවට පත්වුණේ ප්‍රාදේශීය සභා වල සභාපතිවරු ප්‍රාදේශීය සභා නියෝජිතයන්, විශේෂයෙන් එවකට පාලක පක්ෂය නියෝජනය කළ අපි නිසා. මම මුලින්ම ඉල්ලන්නේ මෙම නව රජයෙන් මේ ආකාරයට වෛරය ක්‍රෝධය ද්වේශය වපුරල මේ විනාශකාරී ක්‍රියාවට වග කිව යුතු සියලු දේශපාලකයන්, ඒව මෙහෙයවපු කණ්ඩායම්, ගැන විමර්ශනය කරල ඒවට නිසි දඬුවම් ක්‍රියාත්මක විය යුතුයි කියලා. නැත්නම් දේශපාලනය කියන වචනයම අප්‍රසාදයට ලක්වෙලා හොඳ මිනිසුන් දේශපාලනයට එක් වෙන එක සදහටම නවතිනවා. ඒ වගේම නීතිය රකින ආයතන මෙම සිද්ධියේදී ක්‍රියාකළ ආකාරය ගැන මම කණගාටුවෙනවා. ගරු සභාපතිතුමනි, මේක නරක පූර්වාදර්ශයක් අනාගත දේශපාලනයට. මේක නම් මේ රටේ අනාගත දේශපාලනය මම හිතනවා මට මින් ඉස්සරහට ප්‍රාදේශීය සභාවකවත් නියෝජිතයෙක් වෙන්න ඕන නෑ කියලා. මේක නම් මේ රට භාරගන්න බලන් ඉන්න දේශපාලනය ගරු සභාපතිතුමනි, පුරවැසියෙකු විදියට මේ රට ජීවත් වීමටවත් සුදුසු නෑ කියල මම කියනවා.

ඒ වගේම මේ ක්‍රියාවන් සියල්ල ඉහලින් මෙහෙයවපු දෙයක් තමයි මේ රටේ මාධ්‍ය. විශේෂයෙන් සමාජ මාධ්‍ය මගින් තරුණයන්ට දීපු විෂ, වැරදි පණිවිඩ විශාල වශයෙන් ඉවහල් වුණා මේ විනාශයට. අද සමාජ මාධ්‍ය කියන්නේ ආණ්ඩු පිහිටුවන්න, ආණ්ඩු පෙරළන්න තරම් ප්‍රබල සාධකයක් වෙලා ඉවරයි. සමාජ මාධ්‍යවල යන හොඳ හෝ නරක සියල්ල ජනතාව හරි ඉක්මනට විශ්වාස කරනවා. ගරු මන්ත්‍රීවරුණි, මම මතක් කරන්න කැමතියි මේ සිද්ධියට කලින් ඉඳල ප්‍රාදේශීය සභා නියෝජිතයන් වෙත ප්‍රහාර එල්ල වුණා. මං ළඟ සටහන් කරගත් සාක්ෂි තියෙනවා. තමාගේ ප්‍රදේශයේ මන්ත්‍රීවරයාට , දේශපාලකයාට පහර දෙන්න කියල සමාජ මාධ්‍ය හරහා සමාජ ගත කළ රජයේ නිලධාරීන් පවා ඉන්නවා. ග්‍රාම නිලධාරී කෙනෙක් කියන්නෙ මන්ත්‍රීවරයෙකුට වැඩිය කොට්ඨාසය තුළ මහජනතාවට සමීප පුද්ගලයෙක්. එහෙම කෙනෙක් කියනව නම් හේතුවක් නැතිව ළඟම ඉන්න දේශපාලකයාට පහර දෙන්න කියල ඒක මොන තරම් වැරදිද? අවට රජයේ ආයතනවල, මේ ප්‍රාදේශීය සභාව තුළ වුණත් රජයේ නිලධාරියෙක් විදියට අපි බැඳිල ඉන්නවා වැරදි දේ වැරදි විදියට දකින්න. ඒව අනුමත නොකර වැරදි තැන් එම ආයතන තුළ හඳාගැනීම මිසක් සමාජ මාධ්‍යවලින් එලියට වෙනත් මතයක් දෙන්න උත්සාහ නොකිරීමට. මමත් රජයේ සේවකයෙක් විදියට අපේ දේශපාලන මතය සහ රාජකාරී ගැන අවබෝධයකින් වැඩ කිරීමේ වැදගත්කමත් මම මතක් කරනවා. අරගලයකදී පහර දීම හා ප්‍රතිප්‍රහාර මීට කලින් අපි අත් විඳල තියෙනවා. නමුත් ඒක අමානුෂික අන්තයකට ගෙනිහින් දේශපාලන වෛරයක් බවට පෙරළල මහපාරේ මිනිස්සු බල්ලො බළල්ලු වගේ මරල දාන තත්ත්වයකට පත් කළ අයට සාප දෙන්න කියල මම කියනවා.

වාහනයකට ආදරය කරන කෙනෙකුට කවදාවත් වාහනයක් ගිනි තියන්න බෑ. දුක් විඳල අමාරුවෙන් ගෙයක් හදපු දෙමව්පියෙකුගෙ දරුවෙකුට ගෙයකට ගිනි තියන්න බෑ. ඒත් එහෙම වුණා. හෝටල් කර්මාන්ත ශාලා ගිනි බත් වුණා. ඒ විනාශ වුනේ මේ රටේ ආර්ථිකය. මාලිම්බඩ ප්‍රදේශයේ පවා යම් අය කුපිත කිරීමේ උත්සාහයක යෙදුණත් අපේ බල ප්‍රදේශයේ බුද්ධිමත් තරුණ කොටස් එම ක්‍රියාවලට සම්බන්ධ නොවීම ගැන අපි සතුටුවෙන්න ඕන. ස්තුතිවන්ත වෙන්න ඕන. මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා ඔබලාත් පසුගිය කාලෙ යම් අනුමත කිරීම් කරල තිබුණා සමාජ මාධ්‍ය තුළ. එහෙම නොවී මෙම වැරදි ක්‍රියාවන්ට වචනයකින්වත් අනුබල නොදී මාලිම්බඩ ගැන හිතල මේ පිළිබඳව පක්ෂ භේදයකින් තොරව සංවාදයක් ඇති කර ගත යුතුයි කියල මම කියනවා. ඒ වගේම විශේෂයෙන් මතක් කරන්න ඕන මේ අවාසනාවන්ත දවසේ පාලක පක්ෂයේ නියෝජිතයන් විදියට අපි ලොකු පීඩනයකින් හිටියේ. මේ ක්‍රියාවලට මොන ආකාරයකින් වත් අප සම්බන්ධ නොවූවත් මරණ භය අපටත් දැනුණු දිනයක්. ස්තුතිවන්ත වෙනවා සමන් දෙනිපිටිය මන්ත්‍රීතුමාට. පෞද්ගලිකව අපට කතා කරල නිවෙස්වල කෑම බීම ගැන පවා සොයා බැලීම ගැන. උපදෙස් දුන්නා ඒ වගේම සියලු මන්ත්‍රීවරුන් අප ගැන හෙව්වා. කතා කළා. හැමෝටම ස්තූතියි. මේ වෙලාවේ පාර්ලිමේන්තුමන්ත්‍රීවරයෙක්, ප්‍රාදේශීය සභා සභාපතිවරයෙක් ඇතුළු 09 දෙනෙකුගේ විතර වටිනා ජීවිත අහිමිවෙලා තියෙනවා. දරුවන්ට පියවරු අහිමි වුණා. ඒ සියලු දෙනාට අපගේ බලවත් සංවේගය පල කරනවා. ඒ වගේම රෝහල් ගත වෙලා ඉන්න සියලු දෙනාට, දේපල පොත්පත් අහිමිවෙලා තාමත් දුකින් ඉන්න දරුවන් ඇතුළු සියලු දෙනාට මාගේ කණගාටුව ප්‍රකාශ කරනවා.

<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>

මං හිතන්නෙ සමාජ මාධ්‍ය වැඩිපුර භාවිතා කරපු කාලයක් මේක. හැබැයි අපි හැමෝම මෙතන ප්‍රධාන දේශපාලන කණ්ඩායම් දෙකක් නියෝජනය කරනවා අද දවසේ අද බැලුවොතින් ජ.වි.පෙ. අරගලයේ වෙනස කියලා කතා කරනවා. අපි කවදද දැකලා තියෙන්නෙ මේ සභාවේ ඒ කඳවුර නියෝජනය කරන අය සාධණීය දෙයක් කතා කරනවා. අපි දැක්කා සමාජ මාධ්‍ය වලින් අපේ ගෙවල් වලට ගහන්න, ගිනි තියන්න පෙළඹුවේ ගමේ ජ.වි.පෙ. අපේක්ෂකගේ පුතා. ඔහු පෝස්ට් එකක් හදලා ශෙයාර් කරනවා. අපි පක්ෂ

වෙනුවෙන් රැලිවලට, රැස්වීම්වලට ගිහින් තියෙනවා. හැබැයි අපි කවදත් දේශපාලනය කරේ වැදගත් විදියට. අපි දේශපාලනයට ආවේ අවබෝධයක් ඇතිව. ඒ නිසා අපි අශෝබන දේවල්, අකටයුතු දේවල් වලට දායක වෙන්නෙ නෑ. පක්ෂ නායකයා වෙනුවෙන් අපි ඕන වෙලාවක හිටගෙන තියෙනවා. අපි ඔවුන් වෙනුවෙන් පෙනී ඉඳලා තියෙනවා. අපි ඒකට ලැජ්ජ වෙන්නෙ නෑ. හැබැයි එදා අපි සහභාගී වුනත්, වැරැද්දක් තියෙනවනම් අපි ගෞරවාන්විතව එතැනින් අයින් වෙනවා. ඒක තමයි අපි ඉගෙන ගනිපු දේශපාලන සංස්කෘතිය. සභාපතිතුමා, උපසභාපතිතුමා ජොෂ්ඨ දේශපාලකයන් ඉන්නවා. අපි හැමෝම ඉගෙන ගනිපු දේශපාලන සංස්කෘතිය ඒක.

මාලිම්බඩ අයගේ ඒ සංස්කෘතිය තියෙනවා. මෙතන හැමෝම අපි ගැන හොයල බැලුවා. විපක්ෂයේ මන්ත්‍රීවරු විදියට සියලුම දෙනා පොහොට්ටුවේ මන්ත්‍රීවරු ගැන හොයලා බැලුවා. අපිට ඒ ගෙවල් වල ඇවිත් නවතින්න කියන ආරාධනය කළා. ඒක තමයි විය යුත්තේ. ඒක තමයි අපේ තියෙන මනුෂ්‍යත්වය කියන්නෙ. හැබැයි සමහර උදවිය මොනවත් කරන්න බැරිවුන තැන ගෙදර තිබුණ වතුර බටේ කඩල ගිහින් තිබුණා. අපි ජල සම්පාදන මණ්ඩලයට කතා කළාට මන්ත්‍රීවරයෙක්ගෙ ගෙයක් කිව්වාම වෘත්තීය සමිති ක්‍රියාමාර්ග කියල හදන්න ආවේ නෑ. දේශපාලනය කලත් අපිත් මිනිස්සු. හැබැයි වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් කියල අපේ ගෙදර වතුර බටේ හැදුවේ නෑ. ලයිට් කණුව ගලවන්න උත්සාහ කරල , ලයිට් වයර් කපන්න උත්සහ කරල. ඒ වගේ සුළු දේවල් වුණා. ඒ වගේ පීඩනයක් නම් දෙන්න හදන්නෙ, ඒ මිනිස්සු බලයට ආවාට පස්සෙ කොහෙද රැඳෙන්නෙ. ඒ මිනිස්සුන්ගේ තියෙන්නෙ ක්‍රෝධය, වෛරය, පලිගැනීම් විතරයි. ඒ වගේ දේශපාලන කඳවුරක් තමයි මේක මෙහෙයුවේ. නාගොඩ හන්දියේ, අධිවේගී පිවිසුම ළඟ ඉඳන් මෙයා ගෙදර ඉන්නවා ගිහින් ගහන්න කියලා උපදෙස් දීලා තිබුණා දැන් දැනගන්න ලැබෙනවා මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ සිටින නිලධාරීන් මේක මෙහෙයෙව්වා කියන කාරණාව. ඒ නිලධාරීන්ගෙන් තමයි අහල තියෙන්නෙ කවුද කොළඹ ගියේ කියලා. මාතර නගරයෙන් මට ගෙදර එන්න බැරිව කැකනදුරින් අධිවේගයට දාල ගෙදර එක්ක ආවා. ඒ වෙලාවේ කවුරුහරි කෝල් කරාම මං කිව්වා අධිවේගී මාර්ගයේ ඉන්නෙ කියලා. ඒක වැරදිවිදියට එලියට ගියා. කොළඹ ගිහින් අධිවේගී මාර්ගයේ එනව කියලා සමහර මිනිස්සු හිතුවේ. ඒක අල්ලගෙන මිනිස්සු සංවිධානය වුණා. ඒ ගැන ලැජ්ජවෙනවා.

සමාජ මාධ්‍ය තුලින්, සමහර හිටපු නිලධාරීන්ගෙ සහ දැන් ඉන්න සමහර නිලධාරීන්ගේ හැසිරීම අපි දැක්කා. අපි මීට වඩා බුද්ධිමත් වෙන්න ඕන. මගේ ගෙදර කුඩු කරලා , ගිනිතියලා තවත් කෙනෙක්ගෙ ගෙදරක් ගිනි තියලා මොකද්ද බලාපොරොත්තු වෙන්නෙ? සිස්ටම් චේන්ජ් එකක්ද බලාපොරොත්තු වෙන්නෙ. එහෙම බලාපොරොත්තු වෙනව නම් මේව නෙමෙයි කරන්න තියෙන්නෙ. සමහර අයට සාධාරණ අරගලයක් තියෙනවා. අපි දේශපාලනයේ නිරතවන අය හැටියට අපි දන්නවා මේක ප්‍රජාතන්ත්‍රවාදී රටක්. දෙසිය විසිපහම එපා පලයල්ලා කිව්වට එහෙම යන්න බෑ. එහෙම කියල කරන අරගලවල තේරුමක් නෑ. මැතිවරණයක් එනකන් ඉවසන්න ඕන. ප්‍රජාතන්ත්‍රවාදයෙන් පත්වෙලා ඇවිත් තියෙන්නෙ මේ දෙසිය විසිපහ. එයාලා අයින් කරන්න ඕනත් ප්‍රජාතන්ත්‍රවාදී ලෙසම තමයි. ඒ අයින් කරන ක්‍රමවේදය පෙන්නල තියෙද්දි ගෙවල් ගිනි තියනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් අපි දැක්කා වසර දෙකයි පාර්ලිමේන්තු ඇවිල්ල. හම්බකර ගන්න දෙයක් නෑ. ගහල මරල ඇඳගෙන එනවා. වීඩියෝ එකක් දාලා තිබුණා. සිස්ටම් චේන්ජ් කියලා ඒකටද අපි යන්නෙ. මිනිස්සු මරාගෙන නෙමෙයි අපි යන්න ඕන.

අද උදේ පත්තර බැලුව නම් දකින්න ඇති ඩොලර් බිලයන 18ක ආයෝජකයන් අරගල නිසා හැරිල ගියා. අපිට ඩොලර් නැති ප්‍රශ්නයක් තියෙන්නේ. අපි හැමෝම ඩොලර් වලින් ජීවත්වෙන්න. ඇඳන් ඉන්න ඇඳුමෙ ඉඳල , තෙල්, ගෑස් හැමදේම ඩොලර්. මේ ඩොලර් අදින ක්‍රමයක් කවුරුවත් කල්පනා කළේ නෑ. තියෙන ඩොලර් ටිකත් එලවන්න හදනවා. අපි මේ ආකල්පයි වෙනස් කරන්න ඕන. අපි දේශපාලනය කරන උදවිය හැටියට මිනිසුන්ගේ ඔලුව

හදන්න ඕන. මේ ඔලු හදන් නැතුව මේ රට හදන්න බෑ. මේ රටේ අපි ආදරය පතුරවන්න ඕන. මුලින් වෛරය මතු කරල පස්සෙ ආදරය පතුරවල හරියන්නෑ. සමාජ මාධ්‍ය මීට වඩා හසුරවන්න කියල අපි පාලන අධිකාරියටත් බල කරන්න ඕන. ඇත්තටම අපි දේශපාලනයේ නිරත පිරිසක් හැටියට ජනතාව දැනුවත් කරන්න පුලුවන්. ඒ විදියට සාමකාමී පරිසරයක් බිහිකිරීමට සියලු දෙනාටම ශක්තිය, ධෛර්යය ලැබෙන්න කියල ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා</u>**

මුලින්ම මම අරගලකරුවන්ට එල්ල වූ ප්‍රහාරය හෙළා දකින අතර ඉන් පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට,ආරක්ෂක නිලධාරීන් සහ සිවිල් සංවිධාන නියෝජිතයන් මෙන්ම සාමාන්‍ය පුරවැසියන් ඝාතනය වීම තරයේ හෙළා දකිනවා.

පෞද්ගලික එදිරිවාදිකම් මත සමාජ මාධ්‍ය ජාලා හරහා අපවත් ඝාතනය කරන්න, ප්‍රහාර එල්ල කරන්න බොහෝ පිරිසක් උත්සාහ ගත්තා. මම සමස්ත මාලිම්බඩ ජනතාවට මෙන්ම මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා ඒ ගොඩට නොවැටී අපව ආරක්ෂා කරන්න, සාමය ආරක්ෂා කරන්න, අවස්ථාවාදී නොවී දේශපාලන මතිමතාන්තර මත ඉඳගෙන කටයුතු නොකරමින් ,මිනිසත්කම ඉස්මතු කරමින් කටයුතු කිරීම පිළිබඳව.

නව අගමැතිතුමාගේ ක්‍රියා කලාපය තුළ හෙට දවසේ මේ රටට හොඳක් වෙනවනම් ඔය හොඳක් වෙන අයත් එක්ක කොන්දේසි විරහිතව රට , ජාතිය, ආගම වෙනුවෙන්, නැගී සිටින්න අපි සූදානම් කියන පණිවිඩය දෙනවා.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

බල ප්‍රදේශයේ සියලුම ජනතාව සාමකාමීත්වයෙන් හිටිය කියල අපිට කියන්න බෑ. මොකද එක්තරා කොටසක් හිටියා මේ සාමකාමීත්වය විනාශ කරන්න. මම දන්නවා ඒ කාලය තුළ මට දැනිච්ච මානසික පීඩනය. ඡායාරූපයක් දාලා එදා 9 වෙනිදා දාහකට වැඩි පිරිසක් නාගොඩ හන්දියේ එකතු වෙච්ච වෙලාවේ මට ආරංචිය ලැබුණා මමත් කොළඹ ගියපු කෙනෙක් මටත් ප්‍රහාරයක් දෙන්න කතාවුනා කියලා. ඒ මාලිම්බඩින් තමයි දෙතුන්දෙනෙක් කිව්වෙ. ඒ මොහොතෙම මට ඒ පණිවිඩය ලැබුණා. ඒ වෙලාවේ කණ්ඩායමක් සූදානම් වුනේ මගේ ගේ විනාශ කරන්න. එතන මගේ ඥාතීන් හිටියා. ඒ අය කෙසේවත් අපේ ගෙදරට එන්න ඉඩදුන්නෙ නෑ. ඒක වැලැක්වුවා. ඒ වුනාට ඒ දෝංකාරය එහෙමම පැවතුනා. මගේ දරුවෝ, බිරිඳ ගෙදර හිටියේ නෑ. රෑට වෙනත් ගෙදරක තමයි නිදියන්නෙ. මම එලිවෙකන් නිදි මැරුවා තවත් පිරිසක් එක්ක. අපි ඒ තරම් දැඩි පීඩනයක තමයි ඒ දවස් දෙක තුන හිටියේ. එක්තරා දේශපාලන පක්ෂයක ප්‍රාදේශීය නායකයෝ උත්සහයක් ගත්තා මගේ ගේ ගිනිතියන්න. මට ගහන්න. එදත් භීෂණයට වැඩ කරපු,භීෂණයට වැඩ කරන පක්ෂ තමයි මේකට මූලිකත්වය ගත්තෙ. මගේ ජීවිතය නැතිවුණානම් මගේ දරුවන්ට පියෙක් නෑ. පළමු දවසෙ ආවනම් ඒ දේ සිද්ධවෙනවා අනිවාර්යයෙන්ම. ඒ නිසා මෙවැනි දේශපාලනය අපි තුරන් කරන්න ඕන. මම දන්නවා එක්සත් ජාතික පක්ෂය, අනෙකුත් පක්ෂ මේ වගේ භීෂණයට යන්නෙ නෑ. ඒකට උඩගෙඩි දෙන්නෙ නෑ. හැබැයි හැමදාම මේ දේවල් කරන්නෙ එක් දේශපාලන පක්ෂයක් විතරයි. මිනී මතින් බලය ගන්න හදනවා. අපිට කණගාටුවට තියෙන්නෙ දැනුමක් තියෙන කොටසුත් මේකට එකතු වුණ එක. භීෂණය ගමේ ඉන්න අයගෙන් පටන් ගන්න කියල සමාජ මාධ්‍යවල දැම්ම ජේ.වී.පී. එක එක්ක සම්බන්ධ රජයේ සේවකයෝ තමයි ගමේ මන්ත්‍රීවරයගෙන් පටන්ගන්න කිව්වෙ. ඒව අපි දැඩි ලෙස හෙලා දකිනවා. මේවා විවේචනය කරන්න ඕන. මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා විමලවංශ මන්ත්‍රීතුමාටත් නිලන්ත ධම්මජිත් මන්ත්‍රීතුමාටත්.ඔවුන් නිතරමමම ගැන සොයා බැලුවා. හැමදාමත් බිය වෙන්න බෑ.

හැමදාමත් භීෂණයෙන් බලයට එන්න හදපු පිරිසක් ඉන්නවා. මේ පක්ෂවල අය විදේශ රටවල ඉන්න අපේ රටේ මිනිස්සුන්ගෙන් සල්ලි එන එක වැලැක්කුවා දුන්නොත් රාජපක්ෂලාගේ සාක්කුවට යනවා කියලා. විදේශ සංචාරකයෝ එන එක වැලැක්වුවා. විදේශ රැකියාවල නියුතු අය සල්ලි එවන්නෙ නෑ. මත්කුඩු අලෙවි කරන අයට සල්ලි ටික යන්නෙ. අද සාමාන්‍යයෙන් මිලියන 10ක් 11ක් එදිනෙදා වියදම්වලට මාසෙකට යනවා. ඒ සල්ලි මෙතෙක් සොයගෙන තියෙන්නෙ විදේශ සේවා නියුක්තිකයන්ගෙන් හා සංචාරකයන්ගෙන්. ආනයන හා අපනයන සමතුලනය කරගන්නෙ මේවයින්. හැබැයි ඒවා නැති කලා. මම පක්ෂයක් සුද්ද කරන්නෙ නෑ. අපි ස්ථාවරව හිටියා. මහින්ද රාජපක්ෂ මහතා ඉවත් විය යුතුයි කියන මතයේ අපි මුලින්ම හිටියා. කෙටි මාර්ග වලින් බලය ගැනීමට නොගොස් අර්බුදයක් ඇතිවූ විට අපි එක්සත් විය යුතුයි. මේ වෙලාවේ අපි පක්ෂ පාට භේද සියල්ල අතැරල රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහය දිය යුතුයි.එතුමාට ජාත්‍යන්තරයත් එක්ක සබඳතා තියෙනවා. රටේ අනාගතය මොන විදියට ගමන් කරයිද කියන්න බෑ. රටේ සම්පත් විකිනීම, රටේ සම්පත් විදේශ වලට පැවරීම එතුමාගේ ප්‍රතිපත්ති තුල තිබුණා. අනාගතයේදී කොහොම වෙයිද දන්නෑ. අද අපිට බටහිර රටවල් එකතු වෙලා ඩොලර් ටිකක් එවයි කියන විශ්වාසය තියෙනවා. ඒ විශ්වාසය එක්ක රටක් මේ මොහොතේ නැගිටියි කියලා බලාපොරොත්තු වෙනවා. අතීතයේ දෝෂාරෝපන වලින් නිවැරදි වන්න තියෙන හොඳම වෙලාව මේක. ඒ දේවල් තේරුම් අරන් හරියට වැඩ කලොත් ඒ බලවේගය නවත්වන්න බෑ කාටවත්. එතුමා තමන්ගේ අතීතයේ තිබ්ච්ච වැරදි තේරුම් අරන් මේ වැරදි නොවෙන්න හරියට වැඩ පෙන්නුවොත් හරි.. ඒ වගේම ජේ.වී.පී. එකට තිබුණා අගමැතිකම අරගෙන මේ මාස තුන ඇතුලත විදේශීය ශ්‍රමිකයන්ගෙන් සල්ලි ගෙන්න ගන්න. ඒ වගේම ෆයිල් 15ක් එලියට දැම්මා. අගමැතිකමත්, අධිකරණ ඇමතිකමත් අරගෙන ඒ ෆයිල් ටික උසාවි දැම්මා නම් හොරකම් කරපු අයට දඬුවම් දෙන්නත් හොඳම අවස්ථාව. මුදල් ඇමති කමයි, අධිකරණ ඇමති කමයි අරගෙන පාලනයේ හිටියනම් රටේ හොරු අල්ලගන්න තිබුණා. නමුත් එයාලා ඒක සම්පූර්ණයෙන් මගහැරියා. මිනිස්සු නොමග නොයවා වැඩ කලොත් හොඳයි. මම දේශපාලනය කතා නොකරන්නමයි හිටියේ මේ වෙලාවේ. නමුත් හැමෝම කතා කළ නිසයි කතා කලේ.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව